

# වැව් බැඳි රටේ පැරණි සිරිත්


වලගම්බහුව පයින්ඩිකුලමේ පදිංචි පි. වි. අප්පුනයිදේ මහතා සමග සාකච්ඡාකර සකස් කළේ

**ඩී. ඩබ්ලිව්. පී. බී. තිලකරත්න**

(කෘෂිකර්ම ව්‍යාප්ති සේවක) ගල්මඩුවේ, මහඉලුප්පල්ලම


කන්න ආරම්භ කිරීමට පෙර වැව් බැඳි රටේ ඇත්තෝ ඔවුන්ගේ චිරාගත සම්ප්‍රදයන්ට අනුකූල කටයුතු රාශියක්ම ඉටු කරති. එයින් පළමු. වැන්න හැටියට සැලකිය යුත්තේ, මුට්ටි නැමීම සහ කිරි ඉතිරීම ආදී දේව පූජා පැවැත්වීමයි. දෙවෙනි කාරණය වන්නේ කුඹුරට බැසීමට පෙර මහ මීටිම පැවැත්වීමයි.

මෙම මහ මීටිම පවත්වනු ලබන්නේ, පළාතේ මහ ඒජන්ත උන්නාන්සේගේ ප්‍රධානත්ව-යෙනි. මහ ඒජන්ත උන්නාන්සේත්, වාරිමාර්ග ඉන්ජිනේරු මහත්මයාත්, කෘෂිකර්ම නිලධාරි මහත්වරුත්, ගම්වගා නිලධාරි මහතාත් ( V.C.O. ) වැව් ලේකම් මහත්වරු, වෙල් විදානේ මහත්වරු සමග ගමේ ගොවි මහත්වරු එක්වී

මෙම මීටිම පවත්වති. මෙම ප්‍රධාන වගා රැස්වීම් පවත්වන්නේ මාස් කන්න සඳහා සැප්තැම්බර් මාසයේත්, යල් කන්න සඳහා මාර්තු හෝ අප්‍රියෙල් මාසය තුළදීත්ය. මෙහිදී ඒ ඒ ප්‍රධාන වැව්වල ඒ අවස්ථාවේ තිබෙන වතුර ප්‍රමාණයත්, ඉදිරි කාලයේ බලාපොරොත්තු විය හැකි වර්ෂාව ගැනත් සිතා බලයි. ඉන් පසුවයි වගා කරන කුඹුරු ප්‍රමාණය, වගා කරන කාලය ආදී කරුණු ගැන තීරණ ගෙන වැඩ පටන් ගන්න දින නියම කරගන්නේ.

ඊට පසුව ඒ ඒ ගම්වල ඇත්තෝ ගම් මට්ටමින් මේ මීටිම පවත්වති. මෙහිදී ගමේ වෙල් විදානේ මහතා ගමේ සිටින සියළුම ගොවීන් හා පංගුකරුවන් කැඳවීම සඳහා අනාඥාවක් (දැන්වීමක්) ලියා ගමේ සෙනඟ ගැවසෙන ස්ථානයක හෝ කීපයක අලවා තැබීමෙන් මීටිම පවත්වන දිනය, වේලාව සහ ස්ථානය දැන ගැනීමට සලස්වයි. මෙම මීටිම පවත්වන්නේ සවස් කාලයේදීයි. එහිදී වැවේ තිබෙන ජල ප්‍රමාණය අනුව වැඩ කිරීමට සුදුසු වෙල්යාය, පළමුවෙන් වැඩ පටන්ගන්නා දිනය, වැඩ ඇල්ලීමට සුදුස්සා, මේ සඳහා ඇලවේලි ශුද්ධ කිරීම, වනාත් කෙටීම ආදී මූලික වැදගත් කරුණු සාකච්ඡාකොට, කාරණා තෝරා බේරාගෙන මීටිමේ වැඩ කටයුතු අවසන් කරන්නේ හේනේ පැලට පැල් රැකීම සඳහා යන්නට කල්වේලා ඇතිවයි. එයද තම රැකියාවේම කොටසක් නිසා කාලය ඉතිරි කරගෙන වැඩ කළහ.

වැව් බැඳි රටේ ඇත්තෝ මොනයම්ම කාරියකදී වත්, මීටිමක් සම්මුතියක් (සභා රැස්වීමක්) පවත්වන විට ඊට, ගමේ සිටින සියළු දෙනාගේම ආධාර උපකාර නොඅඩුව ලැබුණා. විනා අද වගේ වැදගත් වැඩක් කරන විට, ඒ ගැන විවේචනය කිරීමක් හෝ කඩාකප්පල් කිරීමේ අදහස් තිබුනේම නැත. එද හිටපු උදවිය වැඩිහිටි අයට බොහොම ගරු සත්කාර කළා. ඒ ඇත්තන්ට අනෙකුත් ලාබාල අය සැලකුවේ දෙමාපියන් හැටියටයි. වැඩිහිටියන් ලාබාල අය දරුවන් ලෙසටයි සැලකුවේ. මෙවැනි උතුම් ගුණාංග හැඟීම්, බැඳීම් ඔවුන් අතරේ තිබුන නිසා, ඒ කාලයේ වැව් බැඳි රටේ සෑම ගමකටම සතුට, සාමය හා සෞභාග්‍යය උදා වුනා. ගමේ වෙල් විදාන මහත්මයා, ගමේ වෙද මහත්මයා, ගමේ ඉස්කෝලේ ලොකු මහත්මයා, ගමේ වැඩිහිටි අය සමගින් ගමේ පන්සලේ ලොකු හාමුදුරුවෝ තමයි, ගමේ දියුණුව සඳහා කෙරෙන පොදු කටයුතුවල මූලිකත්වය ගෙන කටයුතු කළේ. සෑම කෙනෙක්ම තමන්ට පැවරෙන සෑම පොදු වැඩක්ම නොපිරිහෙලා ඉටු කිරීම නිසා ඒ කාලේ වැව් බැඳි රටේ ඇත්තන්හට කෑම බීම අග හිඟ නැතිව සතුටින් ජීවත්වීමට හැකි වුනා. සෑම වසරක් පාසාම ඒ කාලයේ "පස්වැඩ" හා "සුළු වැඩ" කියා රාජකාරී කටයුතු දෙකක් තිබුනා. පස් වැඩ කියන්නේ ගමේ වැවේ වැව ඇතුලෙන් පස් කපා ගෙනවිත් වැව් බැම්මට දමා අළුත් වැඩියා කිරීමයි. මෙයටම කට්ටි කැපීම කියාත් පසුව භාවිතා කරන්නට විය. මෙම පස් කට්ටි කැපීමේ රාජකාරියෙන් පසුව ඇත්තේ සුළු වැඩ රාජකාරියයි. වැව් බැම්මේ වැවෙන කැලය කපා, බැම්ම පිරිසිදුව තබා ගැනීම, හෙවත් "වැකන්ද පොට කෙටීම" කියා හඳුන්වන්නේ සුළු වැඩ රාජකාරියයි. මෙම වැව් රාජකාරිය කළ යුතුව ඇත්තේ වැව යටතේ තමන්ට ඇති කුඹුරු ප්‍රමාණය අනුව වෙල් විදාන මහතා විසින් නියම කරන ආකාරයටය. එම වැඩ කොටස් හරියාකාරව ඉටු නොකරන කෙනෙකුට ගම්බද උසාවිය මගින් නීතිමය කටයුතු කර දඬුවම් පමුණුවනවා. ගමේ වෙල්විදාන මහතාගේ උපදෙස් මත වැව් ලේකම් මහතාත් ගම් වගා නිලධාරී මහතාත් විසින් මෙම රජකාරී කටයුතු නීතියටම කළ නිසා, නීතිය කඩ කරන්නෙක් හිටියා නම් ඒ ඉතාමත් කලාතුරකින් විය හැකියි. සියළු දෙනාම නීතිය ඒ තරමම ගරු කොට සැලකුවා.

අද වගේ වෛරයෙන්, ක්‍රෝධයෙන්, තන්හාවෙන්, අසමගියෙන් හා දේශපාලන භේද ඇතිකරගෙන, පවුල් අවුල්කර, ඇන කොටාගෙන පවුල් අතරේ මතභේද වපුරාගෙන ඔඩු දුවන තුවාලයක් මෙන් කොතැනින් මතුවේදැයි නොදන්නා සමාජයක් එද වැව බැඳි රටේ තිබුනේ නැති නිසා, කවරුත් කාලය ගෙවූයේ එකම පවුලක උපන් අය හැටියටයි. එයට එක හේතුවක් වුනේ ඔවුන් තම පරම්පරා ගති පැවතුම් වලට ගරු කළා පමණක් නොවෙයි ඔවුන් ඒවා ඒ ආකාරයෙන්ම පිළිපැද්දා. මව්පිය උපස්ථානය, ස්වාමි පුරුෂයා හා භාර්යාව ඉතා ආදරයෙන් ප්‍රේමයෙන් ජීවත් වීම, දරුවන්, නෑදැයින් හා අසල්වාසීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම අගය කළා. ඒ නිසා තමයි ඔවුන් අතරේ සතුට, සැනසීම, සමගිය, සමාදනය, එකමුතුකම කියන ගුණාංග රාශියක් පැවතී තිබුනේ.

එදා වැව් බැඳි රටේ නවීන විද්‍යාත්මක ගොවිතැන් රටාවක් අද වගේ දියුණුවී තිබුනේ නැහැ. ඒත් කලට වෙලාවට ගොවිතැන් කර, එය ආරක්ෂා කර ගැනීම සඳහා වැට කඩොලු බැඳ, මුර පැලවල් ආදිය සාදාගෙන, හුඟාක් මහන්සිවී ලබාගත් අස්වැන්න, ප්‍රවේසම් කර ගෙන වී අටුව, වී බරුව හා වී බිස්ස යනුවෙන් සාද ගන්නා ලද ගබඩා වල ගබඩා කරගෙන පරිභෝජනය සඳහා යොදගත්තා මිස, කඩෙන් හාල් ගෙනත් කාලා ජීවත්වුනේ නැහැ. එක කන්නයකදී ලබාගත් අස්වැන්න ඊළඟ අස්වනු කාලය එනතුරු ප්‍රවේසම්කර තබා ගැනීමත්, අරපිරිමැස්මෙන් ජීවත්වීමත් ඉතාමත් ඉහළම කාර්‍යයක් කොට සැලකිය. අවශ්‍ය දේට මිස අනවශ්‍ය විය පැහැදම් වලින් දුරුවී සිටීම පුරුදු පුහුණු කළා. එදා සිටි වනිතාවන් රූප ශෝභාවෙන් පවා ඉතාමත් ලක්ෂණට ජීවත්වූනේ සංකර විලාසිතාවන්ට ගැතිනොවී, උදාරතර සිංහල ගති ගුණ, සිරිත්, විරිත්, අනුව තමන්ගේ ජීවිත හැඩගස්සාගෙන ඒ අනුව ජීවත්වීම අඟේ කළා.

ගුරුවරුන්, දෙමවපියන්, වැඩිහිටියන් කෙරෙහි ඉතාමත් ආදරයෙන්, කරුණාවෙන් සැලකීමට දරුවන්ට පුහුණුවී තිබුනා. නෑදෑයින්, අසල්වාසීන් කෙරෙහි ආදරය දක්වා, ආගන්තුක සත්කාර කරමින් උදාර සිංහල ගතිගුණ වලින් ඔවුන්ගේ හදවත් පිරී තිබුණා,

ගමත්, වැවත්, දාගැබත්, පාසැලත්, ගරුතර මහා සංඝරත්නයත් උතුම්ම වස්තූන් ලෙස සැලකුවා පමණක් නොව, ඒ ඔවුන්ගේ පණමෙන් ආරක්ෂා කළා.

අදත් වැව බැඳි රටේ ඇත්තන් මේ විරෝදාර මවබිය පරම්පරාවට අයිති අයගේ දරුවන් වග සිහිපත් වී කටයුතු කිරීමට අදහස් පහල වූවොත් ඒ අපේම වාසනාවක් නොවේද?

අවාසනාවකට මෙන් දැනට වැව බැඳි රටේ පැරණි ඇත්තන්ගේම දූදරුවන් පමණක් නොවෙයි ජීවත්වන්නේ. වැව ගම් රටට වෙනත් ප්‍රදේශ වලින් පැමිණිලා ස්ථිර පදිංචිවී සිටින අය නිසා ඔවුන්ගේ ගති සිරිත් කරපින්නාගෙන පැරණි සිරිත් අමතක කර දැමීම කණගාටුවට කාරණයකි. මේ අනුව දැනට වැඩි හරියක්ම අසන්නට දකින්නට ලැබෙන්නේ හොඳ සිරිත්වලට වඩා නරක ගති සිරිත් පමණක්ය.

එදා ජීවත්වූ ඇත්තෝ කුඹුරේ වී ටිකත්, හේනේ තල, කුරක්කන්, අබ, බඩ ඉරිඟු ආදී ධාන්‍ය බෝගත්, වට්ටක්කා, කැකිරි, පුහුල් ආදී එළවළු බෝගත්, උඳු, මුං, මෙනේරි, මිරිස් ආදී අතිරේක බෝගත් වගා කරගෙන එයින් සෑහීමකට පත්ව ජීවත්වුනා. නමුත් අද එදාට වැඩිය වෙනස් ගොවිතැන් රටාවකට එළඹිය යුතු බව ඇත්තයි. එදා සිටි අයට සරු පසක් තිබුණා. අද සරු පසක් නැහැ. නමුත් පස සරු කරගෙන ගොවිතැන් කරගැනීමට හැකියි. මේ සඳහා තාක්ෂණය දියුණු කරගත යුතුය. මෙයට උදව් දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අංශ කීපයකින් කටයුතු යොද ඇත. කෘෂිකර්ම ව්‍යාප්ති අංශය, කෘෂිකර්ම අධ්‍යාපන හා පුහුණු අංශය, කෘෂිකර්ම පර්යේෂණ අංශය, ආදියෙන් හා නොයෙකුත් ජන සංනිවේදන මාධ්‍ය-යන් තුළින් ගොවි මහතාගේ දැනීම, අවබෝධය දියුණු කරලීම සඳහා කටයුතු සලසා තිබීම, වැව බැඳි රටට, පමණක් නොව, මුළු රටටම ප්‍රයෝ-ජනයක් හා ආධාරයක් බැව් කිව යුතුය. මෙයින් ප්‍රයෝජන හා ආධාර උපකාරගෙන තමන්ගේ ගොවිතැන් වැඩ ඉතා සාර්ථකව කරගෙන දියුණුවී සිටින අය වැව බැඳි රටේ ද දකින්නට පුළුවන්.

වැව බැඳි රටේ පුරාණයේ සිටි අයගේ ඉතාම වැදගත් සිරිතක්ව තිබුණා සිංහල අළුත් අවුරුදු උත්සවය ගෙවී යනවාත් සමඟ ඔවුන්ගේ දේව පූජා විධි පැවැත්වීම. මෙම දේව පූජාව පවත්වනු ලබන්නේ ගමේ වෙද මහතායි. වෙද මහතා තමා පාරම්පරිකව කරගෙන එන වෛද්‍ය කටයුතුවලට අධිපති, කම්බිලි කඩවර දෙවියන්ට ඔප්පුදෙන ගොටු මංගල්‍යය, මෙය ගෙදර රාජකාරිය හෙවත් "බත් මාලාව" යනුවෙන්ද හඳුන්වනවා. මෙම දේව පූජාව පවත්වන්නේ වෙද මහතාගේ ගෙදර, ගොම මැටි ගා පිරිසිදුකර, කහ දියර ඉස, බදදා හෝ සෙනසුරාද වැනි කෙම්මුර දිනක සවස් කාලයේදීයි. මල් යහන්, ගොටු පිදේනි කපා දෙවියන්ට ගොටු අඩුක්කු ඔප්පු දීම සඳහා පළාතේ දක්ෂ කෝල් මුරකරුවන් විසින් මධ්‍යම රාත්‍රිය ගතවන තුරු කෝල්මුර කවි කීමෙන් හා උඩැක්කි වාදනය කරමින් ගෙදර රාජකාරිය නොහොත් බත් මාලාවේ කටයුතු අවසන් කරති. ගමේ හා අසල්වැසි ගම්වල ලොකු කුඩා කාගේත් නොමසුරු සහයෝගය හා ආධාර උපකාරය මෙම දේව පූජා-වට ලබාදීම එකල වැව බැඳි රටේ ඇත්තන්ගේ සිරිතක්ව පැවතිණි. මෙම දේව පූජාව හමාර කොට ආපසු ගෙවල් දොරවල් බලා යන්නෝ, විශාල සටනකින් ජයගත් සෙබලුන් මෙන් පිරිසිදු සිතෙන් හා මුව පුරා පිරි, ඉතිරියන සිනාවෙන් යුතුව දහසක් පැතුම් පොදි බැඳගෙන ජයග්‍රාහී ලීලාවෙන්ය.

මෙහිදී ගැයෙන කෝල්මුර කවි පන්තියක් එද ඒ ආකාරයෙන්ම මෙහි ලියා එව්මට අදහස් කෙළෙමි.

# කෝල්මුර කවි

නාථ ස්වාමි දෙවියන් හට කී මෙ කවි ඔප්පු ගන්ධ
නාථ ස්වාමි දෙවි දිවසින් මල් යහනේ වැඩ සිටින්ධ
නාථ ස්වාමි දෙවියන්හට දුන් දළ මුර ඔප්පු ගන්ධ
නාථ ස්වාමි දෙවි අවසර මල් යහනට කවි කියන්ධ

විෂ්ණු ස්වාමි දෙවියන් හට කී මෙ කවි ඔප්පු ගන්ධ
විෂ්ණු ස්වාමි දෙවි දිවසින් මල් යහනේ වැඩ සිටින්ධ
විෂ්ණු ස්වාමි දෙවියන් හට දුන් දළ මුර ඔප්පු ගන්ධ
විෂ්ණු ස්වාමි දෙවි අවසර මල් යහනට කවි කියන්ධ

කන්ද කුමරු දෙවියන් හට කී මෙ කවි ඔප්පු ගන්ධ
කන්ද කුමරු දෙවි දිවසින් මල් යහනේ වැඩ සිටින්ධ
කන්ද කුමරු දෙවියන් හට දුන් දළ මුර ඔප්පු ගන්ධ
කන්ද කුමරු දෙවි අවසර මල් යහනට කවි කියන්ධ

සමන් සුරිඳු දෙවියන් හට කී මෙ කවි ඔප්පු ගන්ධ
සමන් සුරිඳු දෙවි දිවසින් මල් යහනේ වැඩ සිටින්ධ
සමන් සුරිඳු දෙවියන් හට දුන් දළ මුර ඔප්පු ගන්ධ
සමන් සුරිඳු දෙවි අවසර මල් යහනට, කවි කියන්ධ

සිද්ද පත්නි දෙවියන් හට කී මෙ කවි ඔප්පු ගන්ධ
සිද්ද පත්නි දෙවි දිවසින් මල් යහනේ වැඩ සිටින්ධ
සිද්ද පත්නි දෙවියන් හට දුන් දළ මුර ඔප්පු ගන්ධ
සිද්ද පත්නි දෙවි අවසර මල් යහනට කවි කියන්ධ

කඹබිලි ස්වාමි දෙවියන් හට කී මෙ කවි ඔප්පු ගන්ධ
කඹබිලි ස්වාමි දෙවි දිවසින් මල් යහනේ වැඩ සිටින්ධ
කමබිලි ස්වාමි දෙවියන් හට දුන් දළ මුර ඔප්පු ගන්ධ
කඹබිලි ස්වාමි දෙවි අවසර මල් යහනට කවි කියන්ධ